

" දේශගුණික විපර්යාසයන්ට
තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථික රටාවක් "

# මහාවාරි - යටතේ වී වගා කරන ක්ෂේත්‍රයන් සඳහා

# රසායනික නොවන වී වගාවේ වල් පැළෑටි පාලනය

## ඒකාබද්ධ වල් පැළෑටි පාලනයට යොමු වෙමු

**01 ක්ෂේත්‍රය අවට වනාත හා ඇල වේලි පිරිසිදු කිරීම.**

නියර, වනාත හා ඇල වේලි වල පවතින සියලුම වල් පැළෑටි ඉවත් කර පිරිසිදු කර ගන්න.

**02 ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන හානිකර වල් පැළෑටි හඳුනා ගැනීම**

පවතින වල් පැළෑටි වර්ග හා ගහනය අනුව වල් පැළෑටි පාලන ක්‍රමවේදයන් යොදා ගැනීම.

උදා:- බටදැල්ල වැනි බහුවාර්ෂික තෘණ වල් පැළෑටි ක්ෂේත්‍රයේ පවතින විට වැඩි අවධානයකින් බිම් සැකසීම කළ යුතුය.

**03 නිවැරදි බිම් සැකසීමේ ක්‍රම යොදා ගැනීම**

**පළමු සී සෑම**

- වර්ෂාපතනය ප්‍රමාණාත්මකව ලැබෙන්නේ නම් පළමු සී සෑම වර්ෂාව සමඟ ආරම්භ කරන්න.
- ජලය ලැබුන පසු පළමු සී සෑම ගැඹුරට සිදු කරන්න (අඟල් 6-9 පමණ පස පෙරලීම).
- පළමු සී සෑමෙන් පසුව පිඩැල්ලෙන් අඩක් වැසෙන පරිදි දින 10-14 පමණ ජලය බැඳ තබා ගන්න.
- බහු වාර්ෂික වල් පැළෑටි පවතින විට මුලික බිම් සැකසීම සඳහා රොටවේටරය භාවිතා කරන්න එපා.

**දෙවන සීසෑම**

- පළමු සී සෑමෙන් පසුව දින 10-14 කට පසු දෙවන සී සෑම සිදු කරන්න.
- දෙවන සී සෑමෙන් පසුව ක්ෂේත්‍රය ජලයෙන් යට කර තබන්න.

**තෙවන බිම් සැකසීම (මඩ කිරීම හා මට්ටම් කිරීම/ පෝරු ගෑම)**

- දෙවන සී සෑමෙන් දින 5-7 කට පසු පෝරු ගෑම සිදු කරන්න (පැළ වූ වල් පැළ යට වන පරිදි).
- දෙවන සී සෑම හා පෝරුගෑම අතර කාල සීමාව තුළ ක්ෂේත්‍රය තුළ ජලය තට්ටුවක් පවත්වා ගන්න.
- මට්ටම් කිරීම ඉතාම සියුම්ව සිදු කරන්න.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

## 04 ගුණාත්මක බිත්තර වී භාවිතය

වල් බීජ හා වල් වී බීජවලින් තොර බිත්තර වී භාවිතය මඟින් ක්ෂේත්‍රයට අලුතින් පැමිණෙන වල් පැළෑටි අවම කර ගත හැකිය.

## 05 සුදුසු ක්ෂේත්‍ර ස්ථාපන ක්‍රම භාවිතය

වල් පැළෑටි මඟින් ගොයමට සිදුකරන තරගකාරිත්වය අවම කරන ක්ෂේත්‍ර ස්ථාපන ක්‍රම භාවිතය වල් පැළෑටි පාලනයට ඉතා වැදගත් වේ.

- **අතින් හෝ යන්ත්‍රානුසාරයෙන් පැළ සිටු වීම**

- ක්ෂේත්‍ර ස්ථාපනයෙන් පසු නිතරම සෙ.මී. 2-3 පමණ ජල තට්ටුවක් පවත්වා ගැනීම.
- වීඩරය භාවිතා කිරීම - පළමු දින 10-12 අතර පේළි අතර යාන්ත්‍රික හෝ බලවේග වල් නෙලනය (වීඩරය) යොදාගෙන වල් පැළෑටි මර්දනය කිරීම.
- පැළ අතර වල් පැළෑටි පවතී නම් අතින් ඉවත් කිරීම.
  තවදුරටත් වල් පැළෑටි පවතින්නේ නම් දෙවන වතාවට ද සති 3-4 කාලය තුළ වීඩරය යොදා ගැනීම.

- **පැරෂුට් ක්‍රමයට බීජ පැළ ස්ථාපනය:**

- දින 10-12 පමණ වයස පැළ ස්ථාපනය කරන අතර ස්ථාපනයේ දී ක්ෂේත්‍රය හොඳින් සකසා මට්ටම් කරගන්න. බීජ පැළ ස්ථාපනය කරන විට හෝ දින 2 කට පසු සෙ.මී. 2-3 පමණ ජල මට්ටමක් දින 21 ක් දක්වා පවත්වා ගන්න.
- වල් පැළෑටි පවතී නම් අතින් ගලවා ඉවත් කරන්න.

- **පේලියට බීජ වැපිරීම**

- බීජ වප්කර භාවිතයෙන් පේලියට ස්ථාපනය කරන්න.
- වීඩරය යොදාගෙන වල් පැළෑටි මර්දනය කිරීම.
- වල් පැළෑටි පවතී නම් අතින් ගලවා ඉවත් කරන්න.

- **ජලයට වී වැපිරීම**

## 06 වල් බීජ කරල් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම

- ක්ෂේත්‍රයේ පවතින වල් බීජ කරල් පැසීමට පෙර ඉවත් කිරීම මඟින් ඉදිරි කන්නයට පසට එකතුවන බීජ ප්‍රමාණය අවම කරගත හැකිය.

## 07 පිරිසිදු ගොවි උපකරණ නිතරම භාවිතය

- බිම් සැකසීමේ හා අස්වනු නෙලීමේ උපකරණ භාවිතයේ දී නිතරම පිරිසිදුකර භාවිතය. විශේෂයෙන් වල් වී සහිත කුඹුරුවල අස්වනු නෙලීමෙන් පසුව යන්ත්‍ර නිතරම පිරිසිදු කරගත යුතුය.

## 08 ජල කළමනාකරණය

- ජලය යනු වල් පැළෑටි පාලනයේ ප්‍රධානතම මෙවලම වේ. එම නිසා වගාව ආරම්භයේ සිටම හැකි සෑම අවස්ථාවකම ජලය සෙ.මී. 2-3 පමණ පවත්වා ගැනීමට කටයුතු කරන්න.